**නැගෙනහිර පළාතේ සහභාගිත්ව වෙරළාශ්‍රිත කලාප ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය පිළිබඳ පසු-සුනාමි ශ්‍රී ලංකා ව්‍යාපෘතිය - 2015**

-----------------------------------------------------------------------------------------------------------

නැගෙනහිර පළාතේ සහභාගිත්ව වෙරළාශ්‍රිත කලාප ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය පිළිබඳ පසු-සුනාමි ශ්‍රී ලංකා ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2009 ජූලි 23 දින එළඹි අංක ජීඒඑෆ්-එෆ්එස්පී-5-එල්කේ දරන ප්‍රදාන ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 5.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ප්‍රදාන ගිවිසුමට අනුව, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කෙසේ වුවද 2012 අප්‍රේල් 04 දින ප්‍රදාන ගිවිසුමට කරනලද සංශෝධනවලට අනුව, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය ලෙස නම් කරන ලදී. පසුව ව්‍යාපෘතියේ කටයුතු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට මාරු කරන ලදී. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ සුනාමි බලපෑමට ලක්වූ ගෝලීයව වැදගත්වන පරිසර පද්ධති පිළිබඳ ප්‍රධාන ප්‍රවාහය ප්‍රතිස්ථාපනය හා කළමනාකරණ සංරක්ෂණය සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට යොමුකිරීම මඟින් තිරසාර ජීවන රටාවට සහායවීම සහ දේශගුණික විපර්යාසයන්ගෙන් පීඩාවට පත්වීම අවම කිරීමයි. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 14.84 ක් වූ අතර එය සමන්විත වන්නේ ගෝලීය පාරිසරික පහසුකම් මූල්‍යායනයෙන් වන එජඩො මිලියන 7.27 කින් සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලින් එජඩො මිලියන 7.08 කින්, ලෝක සංරක්ෂණ සංගමයෙන් එජඩො මිලියන 0.06 කින් හා සහ ශ්‍රී ලංකා රජයෙන් එජඩො මිලියන 0.43 කින් වන දායකත්වයකින් සැදුම්ලත් එජඩො මිලියන 7.57 කින් සමන්විත සහ - මූල්‍යායනයෙනි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 සැප්තැම්බර් 10 දින ආරම්භ කරන ලද අතර, 2015 සැප්තැම්බර් 10 වනවිට නිම කිරීමට නියමිතව තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට සහ කෘෂිකර්ම සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලේ ව්‍යාපෘති විගණනය සඳහා වූ මාර්ගෝපදේශවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල

ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතන විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදලේ ව්‍යාපෘති විගණනය සඳහා වන මාර්ගෝපදේශවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙනයනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන නියෝජිතායතන | 14.41 | 1,929.10 | 270 | 1.33 | 180.63 | 4.04 | 528.26 |
| ශ්‍රී ලං ර | 0.43 | 55.90 | 30 | 0.04 | 6.22 | 0.15 | 20.80 |
| එකතුව | 14.84 | 1,985.00 | 300 | 1.37 | 186.85 | 4.19 | 549.06 |

ඉහත තොරතුරු අනුව, ප්‍රදාන නියෝජිතායතන විසින් වෙන් කරන ලද රු.මිලියන 1,929.10 කට සමාන එජඩො මිලියන 14.41 ක් වූ මුළු ප්‍රදාන මුදලින් රු.මිලියන 528.26 කට සමාන එජඩො මිලියන 4.04 ක මුදලක් පමණක් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද දිනයේ සිට වර්ෂ 05 ක් ඉකුත් වීමෙන් පසු 2015 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කර තිබුණි. එබැවින් ඉතිරි වර්ෂ 01 ක මෙහෙයුම් කාල පරිච්ඡේදය තුළ ප්‍රදාන මුදල් උපයෝජනය කිරීමේ හැකියාව සැකසහිතව පවතී.

### 3.2 භෞතික ප්‍රගතිය

ප්‍රධාන වෙරළාශ්‍රිත පරිසර පද්ධති පිළිබඳ ඵලදායී ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණය සඳහා වඩා යහපත් ක්‍රම සංවර්ධනය හා ප්‍රදර්ශනය කිරීම, ඵලදායී පරිසර පද්ධති ප්‍රධාන ප්‍රවාහයන් සිදුකිරීම සහ තිරසාර කළමනාකරණය, වෙරළාශ්‍රිත ප්‍රජාවන් බලගැන්වීම සහ ඉගෙනීම්, ඇගයීම් හා යොදා ගැනීම් කළමනාකරණය ආදියෙන් ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් සමන්විත වේ. එබැවින් ඉහත සඳහන් ප්‍රධාන කාර්යයන් යටතේ සිදු කළ යුතු උප කාර්යයන් 71 ක් සිදු කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් ඉන් උප කාර්යයන් 60 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද උප කාර්යයන් පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් රු.මිලියන 3.4 ක මුළු පිරිවැයකට වාහරෙයි හි පරිසර උද්‍යානයක් ඉදිකර, 2014 දෙසැම්බර් 26 දින මඩකලපුව දිස්ත්‍රික්කයේ වාහරෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දී තිබුණි. කෙසේ වුවද අරමුණු කළ කාර්යය වූ පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය කිරීම පිළිබඳව ප්‍රදේශයේ ජීවත් වන ජනතාව සඳහා ප්‍රදර්ශනය කිරීමට උද්‍යානය උපයෝජනය කර නොතිබුණි.

(ආ) වාහරෙයි ප්‍රදේශයේ කෘෂි ළිං 36 ක් ඉදිකිරීම සඳහා වෙන්කරන ලද රු.මිලියන 9 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් තෝරාගත් ප්‍රතිලාභීන්ට කොටස් ගෙවීමක් සිදු කිරීම සඳහා 2015 සැප්තැම්බර් 29 දින වාහරෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ප්‍රේෂණය කර තිබූ රු.මිලියන 1.80 ක මුදලක් අරමුණු කළ කාර්යය සඳහා උපයෝජනය කිරීමෙන් තොරව 2016 මැයි 31 වන විටත් සමෘද්ධි බැංකු ගිණුමේ තැන්පත් කර තිබුණි.

(ඈ) මඩකලපුව, කලපු සීමාව වෙන්කිරීමේ උප කාර්යය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක ප්‍රදේශය ආවරණය කරමින් කලපුව වටා කොන්ක්‍රීට් කුළුණු 12,800 ක් සවිකිරීමට රු.මිලියන 31.7 ක ඇස්තමේන්තුගත මුළු පිරිවැයකට කොන්ත්‍රාත් 03 ක් ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද 2015 ජුනි 30 වන විට සීමා වෙන්කිරීමේ කාර්යයන් නිම කිරීමට අපේක්ෂා කර තිබුණද, 2016 අප්‍රේල් 30 දක්වා කොන්ක්‍රීට් කුළුණු 5,759 ක් පමණක් සවිකර තිබුණි.

(ඇ) කලපු ධීවර සංගමය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සුදුසු ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් රු.මිලියන 17 ක් වූ වෙන්කිරීම යටතේ සිදුකළ යුතු කෝකිලායි හි කලපු කළමනාකරණ කමිටුව ශක්තිමත් කිරීමේ උප කාර්යය පසුව අත්හැර දමා තිබුණි. තවද රු.මිලියන 4 ක වෙන්කිරීම යටතේ කුච්චවේලි ප්‍රදේශයේ ජනතාව සඳහා ක්‍රියාත්මක කළ වැසි ජල අස්වනු උප කාර්යයද එම කාර්යය සඳහා සැලසුම් කළ කොන්ක්‍රීට් ජල ටැංකි යොදා ගැනීම ප්‍රතිලාභීන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අත්හැර දමා තිබුණි.

(ඉ) කින්නියා නගර සභාව සඳහා ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.මිලියන 7.2 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැයකර තිබුණද, කසල ප්‍රවාහනය සඳහා ට්‍රැක්ටර් සහ කම්පැක්ටර්ස් යනාදී වත්කම් නොමැති වීම හේතුවෙන් නගර සභාව විසින් එම කාර්යය සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.